පළාත් පාලන සහ පළාත් සභා චක්‍රලේඛ අංක - 01/2013

පිඑල්/6/11/33/3 වෙළුම 02

2013.01.02

සියළුම පළාත් ප්‍රධාන ලේකම්වරුන් වෙත,

<u>පළාත් සභාවල මන්ත්‍රීවරුන්ට තීරුබදු රහිත වාහන ආනයනය කිරීම සඳහා බලපත්‍ර නිකුත් කිරීම</u>

පළාත් සභා මන්ත්‍රීවරුන්ට සහනදායී පදනම මත මෝටර් රථ ආනයනය කිරීමට / නව කොටස් සහ උපාංග යොදා දේශීයව නිෂ්පාදනය කරන ලද මෝටර් රථ මිළදී ගැනීමට බලපත්‍ර ලබාදීම සඳහා වූ යෝජනා ක්‍රමය 2013.01.02 දින සිට ක්‍රියාත්මක වේ.

01. යෝග්‍යතාව හා සුදුසුකම්

අයදුම්පත්‍රය ඉදිරිපත් කරන දිනට කවර හෝ පළාත් සභාවක වසර 2 ½ ක මන්ත්‍රීධුර කාලයක් සහිත හා එදිනට ධූරය දරන පූර්වාසන්න වසර පහක් තුළ (ණයවර ලිපි විවෘත කළ දින සිට) කුමන හෝ සහනදායි යෝජනා ක්‍රමයක් යටතේ මෝටර් රථයක් ආනයනය කර නොමැති පළාත් සභා ගරු මන්ත්‍රීවරුන් මෙහි දෙවන ඡේදය යටතේ සඳහන් කොන්දේසි, නියමයන් හා බදු සහනයන්ට යටත්ව වාහනයක් ආනයනයට / මිළදී ගැනීමට බලපත්‍රයක් ලබාගැනීම සඳහා සුදුසුකම් ලබයි.

02. කොන්දේසි, නියමයන් සහ සහන

2.1. කොන්දේසි, නියමයන් සහ බදු සහන

(අ) (1) <u>පළාත් ප්‍රධාන අමාත්‍යවරුන් සඳහා</u>

වර්තමාන පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරයෙකුට හිමි මි.ර.ගැ.වටිනාකමින් හා ඒ හා සමාන බදු සහනවලින් යුත් බලපත්‍රයක් සඳහා හිමිකම් ලබනු ඇත.

(ii) <u>අනෙකුත් නියෝජිතයන් සඳහා</u>

(ඒ) ආනයනය / මිළදී ගැනීම කළයුතු මෝටර් රථයේ මි.ර.ගැ.වටිනාකමඇමරිකා එක්සත් ජනපද ඩොලර් 40,000 ක් හෝ 2013.01.02 දිනට පැවති විදේශ විනිමය අනුපාත මත ඒ හා සමාන අනෙකුත් විදේශ මුදල් ප්‍රමාණයකින් යුතු බලපත්‍රයක් සඳහා හිමිකම් ලබනු ඇත.

(බී) ආනයනය කරන මෝටර් රථ සඳහා එකතු කල අගය මත බදු (VAT), වරාය හා ගුවන්තොටුපළ සංවර්ධන බදු (PAL) හා ජාතිය ගොඩනැගීමේ බදු (NBT) ඇතුලත්ව ගෙවිය යුතු මුළු බදු ප්‍රතිශතය අදාල මෝටර් රථයේ මි.ර.ගැ. වටිනාකමින් 40%ක ප්‍රමාණයට ගැලපෙන පරිදි නිෂ්පාදන (විශේෂ විධි විධාන) බදු හා රේගු බදු ගැලපීම් අනුව ගෙවිය යුතුවේ.

(ආ) ආනයනය කරන/ මිලදී ගනු ලබන මෝටර් රථයේ මි.ර.ගැ.වටිනාකම, බදු සහන සහිතව ඇ.එ.ජ.ඩොලර් 5000 ක් දක්වා පමණක් ඉක්මවා යා හැකි අතර,එසේ ඉක්මවා යන ඇ.එ.ජ.ඩොලර් 5000 සඳහා සහන බදු ප්‍රතිශතයට අමතරව සම්පූර්ණ ආනයන තීරු බද්ද ගෙවිය යුතු වේ. කුමන හෝ හේතුවක් මත එකී සීමාව ඉක්මවා යන්නේ නම් කිසිදු බදු සහනයක් හිමි නොවන අතර, එය සාමාන්‍ය ආනයනයක් සේ සලකා පවත්නා සියළුම බදු හා ගාස්තු ගෙවිය යුතු වේ.

(ඇ) ආනයනය කරන මෝටර් රථ සඳහා ඉන්ධන වර්ගය, උපරිම එන්ජින් ධාරිතාවය හෝ පැවරීම සම්බන්ධයෙන් කිසිදු කොන්දේසියක් අදාල නොවනු ඇත.

2.2. අයදුම්කරු විසින් ඉදිරිපත් කර ඇති තොරතුරු සාවද්‍යයැයි තහවුරු වුවහොත්, මෙම යෝජනා ක්‍රමය යටතේ නිකුත් කරන ලද බලපත්‍රය අවලංගු කරනු ලැබේ.

03. ක්‍රියාපටිපාටිය

(අ). මෙම යෝජනා ක්‍රමය යටතේ සහනදායි මෝටර් රථ ආනයන / මිළදී ගැනීමේ බලපත්‍රයක් ලබා ගැනීමට බලාපොරොත්තු වන සහ සුදුසුකම් සපුරා ඇති පළාත් සභා මන්ත්‍රීවරුන් පමණක් මෙම චක්‍රලේඛයේ ඇමුණුම් 1 යටතේ දැක්වෙන අයදුම්පත්‍රය මඟින් ඉල්ලීමක් පළාතේ සභා ලේකම්ගේ සහ ප්‍රධාන ලේකම්ගේ නිර්දේශය සහිතව පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍යාංශයේ ලේකම් වෙත ඉදිරිපත් කළ යුතුවේ.

(ආ). ඉහත නිර්දේශ පදනම් කරගෙන පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍යාංශයේ ලේකම් විසින් සහනදායි මෝටර් රථ ආනයන / මිළදී ගැනීමේ බලපත්‍රයක් නිකුත් කෙරෙනු ඇත.

04. මෙම චක්‍රලේඛය මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ එකඟතාවය මත නිකුත් කරන ලදි.

ආර්.ඒ.ඒ.කේ.රණවක
ලේකම්
පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍යාංශය

<u>පිටපත්</u>

1. ජනාධිපති ලේකම්
2. අග්‍රාමාත්‍ය ලේකම්
3. අමාත්‍ය මණ්ඩලයේ ලේකම්
4. මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ ලේකම්
5. විගණකාධිපති
6. අධ්‍යක්ෂ ජනරාල්, ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව
7. කොමසාරිස් ජනරාල්, මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව
8. අධ්‍යක්ෂ ජනරාල් වෙළඳ තීරුබදු හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව
9. සියළුම පළාත් ආණ්ඩුකාර ලේකම්වරුන්
10. සියළුම පළාත් සභා,සභා ලේකම්වරුන්

} කා.දැ.ගැ.පි